# කිරි ඉන්නන් (Molluscum Contagiosum)

## 01. කිරි ඉන්නන් යනු කුමක්ද?

සමාජයේ බහුලව දක්නට ලැබෙන, වෛරසයක් නිසා හට ගන්නා ඉන්නන් විශේෂයකි. මෙය එක් පුද්ගලයකුගෙන් තවත් අයෙකුට බෝවිය හැකියි. බොහෝ විට මෙය වැළදෙන්නේ කුඩා දරුවන්ට සහ යෞවනයන්ට වන අතර, ඇතැම් විට මෙම තත්ත්වය වැඩිහිටියන්ගේද දක්නට ලැබේ.

## 02. මෙම රෝගය ඇති වන්නේ කෙසේද?

කිරි ඉන්නන් pox වෛරස කාණ්ඩයට අයත් වෛරසයක් මගින් ඇතිවන රෝගී තත්ත්වයකි. මෙය ආසාදිත පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට ස්පර්ශය මගින් හෝ ආසාදිත ඇඳුම්/තුවා/ඇඳ ඇතිරිලි භාවිතයෙන් බෝවිය හැකිය.

මෙය ජානගත රෝගයක් හෝ පාරම්පරික රෝගයක් නොවේ.

## 03. මෙහි රෝග ලක්ෂණ මොනවාද?

සමේ පැහැති, දිලිසෙන සුළු ස්වභාවයක් ඇති 2 - 6 mm අතර ප්‍රමාණයේ කුඩා ගැටිති මෙහි රෝග ලක්ෂණ වේ. කලාතුරකින් කැසීම් සහ පැසවීම ඇති වේ.

## 04. කිරි ඉන්නන් හඳුනා ගන්නේ කෙසේද?

චර්ම රෝග වෛද්‍යවරයෙකුට මෙම රෝගය පහසුවෙන් හඳුනාගත හැකිය.

**05. මෙම රෝගය සුව කළ හැකිද?**

සාමාන්‍යයෙන් මෙය ස්වප්‍රතිශක්තිය මගින් සුව වන රෝගයකි. නමුත් ඉන්නන් අධික ලෙස ඇතිවිට හෝ ස්වයං සුවවීම ප්‍රමාද වූ විට හෝ කැසීම් / ආසාදිත තත්ත්වයක් ඇති විට හෝ ප්‍රතිකාර ක්‍රම සඳහා යොමුවිය යුතුය. නිසි ප්‍රතිකාර භාවිතා කිරිම මගින් මෙම රෝගය නිට්ටාවට සුව කළ හැකිය.

**06. මේ සඳහා ඇති ප්‍රතිකාර ක්‍රම මොනවාද?**

කිරි ඉන්නන් තමා විසින් කැඩීම / මිරිකීම සිදු කළ හැක. එවිට ඉන්නන්ට එරෙහිව ප්‍රතිශක්තිය වර්ධනය වී රෝගය සුව වේ.

එසේ කළ නොහැකි නම් අනෙකුත් ප්‍රතිකාර ක්‍රමවලට යොමු විය යුතුය. ඒවා නම්,

1. ආලේපන ප්‍රතිකාර ක්‍රම - උදා : TCA (Trichloroacetic acid)
2. Cryo ප්‍රතිකාර ක්‍රම (අධිශීත කල ද්‍රව $N_2$ වායුව)
3. Electro - Cautery ප්‍රතිකාර ක්‍රමය

**07. කිරි ඉන්නන් ආසාදිත රෝගියෙකු පිළිපැදිය යුතු සෞඛ්‍ය පුරුදු මොනවාද?**

මෙය තවත් අයෙකුට බෝවීම වැළැක්වීම සඳහා තමාටම පමණක් වෙන්වූ තුවා, ඇඳුම්, ඇඳ ඇතිරිලි භාවිතා කළ යුතුයි.

- කිරි ඉන්නන් සිටීම, පාසැල් නොයැවීමට කාරණයක් නොවේ.